රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක: 60

මගේ අංකය : PED/ප්‍රති/1/චක්‍රලේඛ/2011
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01
2011.04.29

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
රාජ්‍ය ව්‍යාපාර සභාපතිවරුන් වෙත

<u>රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයින් විශ්‍රාම ගැන්වීමේ වයස</u>

රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයන්ගේ විශ්‍රාම ගැන්වීම සම්බන්ධව පහත සඳහන් විධිවිධාන 2011 මැයි 01 දින සිට ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇත.

1. රාජ්‍ය ව්‍යවසායන්හි නිලධාරීන්ගේ වෛකල්පිත විශ්‍රාම ගැනීමේ වයස අවු:55ක් විය යුතුය.

2. කිසියම් පාර්ලිමේන්තු පනතක් මගින් විශ්‍රාම ගැන්වීමේ වයස නිශ්චිතවම තීරණය කර ඇති රාජ්‍ය ව්‍යවසායන්හි හැර අනිකුත් රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයින්ට ස්ව කැමැත්ත මත සේවා දිගුවක් ඉල්ලීමකින් තොරව වයස අවු: 57 දක්වා සේවය කල හැකිය.

3. වයස අවු: 57න් ඔබ්බට අවු: 60 දක්වා සේවය කිරීමට සේවකයා ඉල්ලීමක් ඉදිරිපත් කරන අවස්ථාවලදී එම ආයතනය සඳහා වන සේවා අවශ්‍යතාවය හා සේවකයාගේ කාර්ය සාධනය යන කරුණු සැලකිල්ලට ගෙන වසරින් වසර සේවා දිගුවන් ලබාදීමට අදාල රාජ්‍ය ව්‍යවසායේ පාලක මණ්ඩලයට ක්‍රියා කල හැකිය.

රාජ්‍ය ව්‍යවසායන්හි ඉහළ කළමණාකරණ ශ්‍රේණිවලට අයත් නිලධාරීන් විශ්‍රාම යැමේදී ඇතිවන පුරප්පාඩු පිරවීම සඳහා සුදුසු අනුප්‍රාප්තික සැලසුම් පිළියෙල කිරීම පාලක මණ්ඩලයේ වගකීම වේ.

රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයින්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස සම්බන්ධව මීට පෙර නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 44 හා 52 චක්‍රලේඛයන් මෙමගින් අවලංගු කරනු ලැබේ.

මේ සම්බන්ධව යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් එස්.ආර්. ආටිගල මහතා (දු.අ. 2484617) හෝ අධ්‍යක්ෂ ඩී.සී. සිරිබද්දන මහතා (දු.අ. 2484859) කරුණාකර අමතනු මැනවි.

**පී.බී. ජයසුන්දර,**
**භාණ්ඩාගාරයේ ලේකම්.**

පිටපත්:- 1. ජනාධිපති ලේකම්
2. අමාත්‍ය මණ්ඩල ලේකම්
3. විගණකාධිපති
4. ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
5. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
6. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව